## වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2017

-----------------------------------------------------------------------------------------------

වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව(ඒඩීබී) අතර එළඹී 2009 ජුනි 29 දිනැති අංක 2477 එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය, 2009 ජුනි 29 දිනැති ප්‍රදාන අංක 0129/0130 එස්ආර්අයි (එස්එෆ්) සහ 2013 පෙබරවාරි 13 දිනැති 2977- එස්ආර්අයි (එස්එෆ්) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාතේ මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්ක සහ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය ඇතුළත් ශ්‍රී ලංකාවේ උතුරු හා වයඹ වියළි කලාපීය නාගරික ජනගහනයේ භෞතික සුභසාධනය වැඩි දියුණු කිරීමයි. ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 19,165 කට සමාන එජඩො මිලියන 163.33 ක් වූ අතර ඉන් රු. මිලියන 11,809 කට සමාන එජඩො මිලියන 99.78 ක් ණයක් ලෙස සහ රු.මිලියන 2,649 කට සමාන එජඩො මිලියන 23.22 ක් ප්‍රදානයක් ලෙස ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ජල මූල්‍යයන හවුල්කරු පහසුකම් සඳහා රු.මිලියන 228 කට සමාන එජඩො මිලියන 2 ක ප්‍රදානයක් ආසියානු සංවර්ධන බැංකුව හරහා සිදු කිරීමට නෙදර්ලන්ත භාර අරමුදල ද (නෙ භා අ) එකඟ වී තිබූ අතර රු. මිලියන 4,479 කට සමාන එජඩො මිලියන 38.33 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 නොවැම්බර් 13 දින ආරම්භ කළ අතර 2013 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ව්‍යාපාතියේ කාර්යය නිම කිරිමේ දිනය 2018 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4. විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ

අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය හා ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ණය නියෝජිතායතනය විසින් 2017 දෙසැම්බර් 31 දින දක්වා අය කරන ලද රු.මිලියන 185.92 ක පොලී වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද එකතුව රු. මිලියන 133.05 ක් වූ එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට රජයේ දායකයෙන් ලත් මුදල් වලට එරෙහිව හිලව් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රජයේ දායකය හා කෙරී ගෙන යන වැඩ එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

ණය ගිවිසුමේ උපලේඛන 05 හි , 18 වන ඡේදය ප්‍රකාරව නගර සභා විසින් පිරියම් කළ අපද්‍රව්‍යවල ප්‍රමාණය හා ගුණත්වය, අපද්‍රව්‍ය මුදාහරින ජලයේ ගුණත්වය සහ වියළි මලාපවාහන අපද්‍රව්‍යවල අඩංගු බැක්ටීරියාවල ගුණත්වය නිරන්තරව අධීක්ෂණය කළ යුතුය. කෙසේ වෙතත් නගර සභා විසින් කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා වන අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන බවට කිසිදු තොරතුරක් නොලැබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ දී හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය හා ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ- ණය | | | | | | | |
| 2477 | 59.78 | 6,820 | | 2.73 | 325 | 44.02 | 5,922 |
| 2977 | 40.00 | 4,989 | 1,364 | 3.35 | 479 | 23.48 | 3,192 |
| ආසබැ- ප්‍රදාන | | | | | | | |
| 129 | 23.22 | 2,649 | | 7.13 | 993 | 23.15 | 3,163 |
| 130 | 2.00 | 228 | 1,000 | 0.23 | 05 | 1.78 | 210 |
| ශ්‍රීලංර | 38.33 | 4,479 | 150 | 1.81 | 278 | 23.05 | 3,118 |
| එකතුව | **163.33** | **19,165** | **2,514** | **15.25** | **2080** | **115.48** | **15,605** |

අතාත්වික රේට පදනම් කර ගනිමින් සිදු කළ පිරිවැය ඇස්තමේන්තු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා කරන ලද එජඩො මිලියන 113.33 ක ආරම්භක වෙන්කිරීම පසුව ණය ලබා දෙන නියෝජිතායතනය විසින් එජඩො මිලියන 163.33 ක් දක්වා වැඩි කර තිබුණි. කෙසේ වෙතත් අරමුදල් උපයෝජනයේ මන්දගාමී ප්‍රගතිය අඛණ්ඩව වාර්තා විය. එම නිසා ව්‍යාපෘතියේ කාර්යය ආරම්භ කර වසර 4 ½ ක් ගත වුවත් සංශෝධිත ප්‍රතිපාදනයෙන් එ.ජ.ඩො. මිලියන 115.48 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

උතුරු හා වයඹ පළාත් වල නාගරික ජනතාවගේ භෞතික සමෘද්ධිය වැඩිදියුණු කිරීම පිණිස එම ප්‍රදේශ වල ජල සම්පාදන හා සෞඛ්‍ය ආරක්ෂණ කටයුතු කිහිපයක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ භූගත ජල සංවර්ධන කාර්ය, නව ජල පිරිපහදු පිරියත ඉදි කිරීම, පයිප්ප සැපයීම හා එලීම, හලාවත, පුත්තලම, වවුනියාව සහ මන්නාරම ප්‍රදේශවල ප්‍රධාන ජල සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ පද්ධතිය සඳහා නල සවි කිරීම වැනි ව්‍යාපෘති කාර්යයන්හි ප්‍රගතිය සියයට 40 සිට සියයට 98 දක්වා පරාසයක පැවතුණි. තවද විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ඉන් බැහැරවීම් හඳුනාගැනීම් හා අවශ්‍ය පිළියම් ක්‍රියා මාර්ග ගැනීමට හැකි වන පරිදි කාලීන ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් රු.මිලියන 88.20ක ඇස්තමේන්තු පිරිවැයකට 2017 අප්‍රේල් මස ප්‍රදානය කරන ලද අපජල පිරිපහදු පිරියතේ සිට වවුනියා දිස්ත්‍රික්කයේ පේරු ආරු ජලාශය දක්වා අපජල පිටවීමේ පයිප්ප පද්ධතිය සැපයීමේ හා එලීමේ කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 31 දිනට සියයට 40ක මන්දගාමී ප්‍රගතියක පැවතුණි. කෙසේ වුවද කොන්ත්‍රාත් කාල සීමාව 2018 අප්‍රේල් 20 දක්වා දීර්ඝ කර තිබුණි.

(ආ) ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 1,160.58 කට 2014 වර්ෂයේ පිරිනමන ලද හලාවත පුත්තලම ප්‍රධාන ජල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතිය සඳහා මීටර් 218,000ක පයිප්ප සැපයීම, එළීම හා නල සවි කිරීමේ කොන්ත්‍රාත්තුව 2018 පෙබරවාරි මස නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද 2018 මැයි 31 දින වන විටත් පයිප්ප එළීම සිදුකර තිබුණේ මීටර් 210,630ක දුර ප්‍රමාණයක් සඳහා පමණි. කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තුව නිවැරදිව පිළියෙල නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 දින දක්වා කරන ලද වැඩ අයිතම් 14 ක් සඳහා රු.මිලියන 126.20ක් ඉතිරිවීම් ද තිබියදීත් අතිරේක වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරු රු.මිලියන 181.12 ක මිල විචලතා ඉදිරිපත් කර තිබුණි.

(ඇ) ලද තොරතුරු අනුව කොන්ත්‍රාත්කරුට මන්නාරම ජල රඳවන ආකෘතිය ඉදිකිරීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 39.16ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත් ගිවිසුමේ කාණ්ඩ 6B2.14.2 පරිදි අනිවාර්ය අමතර කොටස් (Mandatory Spare Parts) කොන්ත්‍රාත්කරු විසින් භාර දී නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, පයිප්ප සැපයීම හා එළීමේ කොන්ත්‍රාත් කාලය සහ වවුනියාව, හලාවත හා පුත්තලම ජල පිරිපහදු පිරියත ඉදි කිරීම, මන්නාරම භූගත ජල සංවර්ධනයේ විදුලි හා කාර්මික කටයුතු, භූගත ජල සංවර්ධනය යටතේ මුරුක්කන් හි නව ගැඹුරු ළිං හා බද්ධ ළිං ආදිය 2017 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කල යුතු වුවත්,අදාල කොන්ත්‍රාත්කරුවන් කාර්ය නිම කිරීම සඳහා ව්‍යාපෘතියෙන් කාල දිගුවක් ලබා නොගෙන ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කරමින් පැවතුණි.

## 3.4 පෙර විගණන වාර්තාවෙන් පෙන්වා දුන් නොවිසඳුණු කරුණු

මාගේ පෙර විගණන වාර්තාවෙන් පහත කරුණු අවධාරණය කළද, ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය අදාල කරුණු විමර්ශනය කිරීමට හා නිසි ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි.

(අ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කල යුතු බවට 2013 අප්‍රේල් 05 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමකදී තීරණය කර තිබුණි. කෙසේ වුවත් 2017 දෙසැම්බර් 31 දින දක්වාත් සුදුසු යාන්ත්‍රණයක් දෙපාර්ශවය විසින්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ජලාශ 03 ක් නවීකරණය හා වී වගාව සඳහා පතියාකුලම් හා කට්කුලම් හී ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගැනීමකින් තොරව වවුනියාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය 2014 දී අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් සහකාර කොමසාරිස් ඒ අනුව කටයුතු නොකිරීම නිසා කටයුතු ප්‍රමාද වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් වන්දි හා යටිතල පහසුකම් ලෙස ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් රු.මිලියන 21.8ක් පෙර වර්ෂවල අතිරේකව ගෙවා තිබුණි.

(ඇ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩරය පිරිනැමීමෙන් පසු දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. ව්‍යාපෘතිය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹී කොන්ත්‍රාත්කරුවන් තිස්දෙදෙනෙකු විසින් ඉහත සඳහන් අවශ්‍යතාවයන්වලට අනුකූල වී නොතිබුණි.

### 3.5 මූල්‍ය පාලන ගැටලු

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ කටයුතු විගණනයට භාජනය කර නොතිබුණු අතර 2016 ජුනි 10 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 02/2016 පරිදි අභ්‍යන්තර විගණකයෙක් බඳවාගෙන නොතිබුණි.

### 3.6 පරිබාහිර ගනුදෙනු

ණය නියෝජිතායතනයේ අනුමැතිය යටතේ ව්‍යාපෘතිය විසින් 2017 මැයි 19 දින උතුරු හා වයඹ පළාතේ ප්‍රාදේශීය උපකාර මධ්‍යස්ථාන සඳහා රු.මිලියන 16.95ක පිරිවැයකට මෝටර් රථ 02ක් මිලට ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද, අදාල වාහන ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට දායක නොවන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දකුණු ප්‍රාදේශීය කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ට වෙන්කර දී තිබුණි.

### 3.7 මතභේදයට තුඩු දෙනු කරුණු

හලාවත හා පුත්තලම ප්‍රදේශ වල භූගත ජල සංවර්ධන කටයුතුවලට අදාල සිවිල්, විදුලි හා කාර්මික කටයුතු කොන්ත්‍රාත්තුව යටතේ ව්‍යාපෘතිය විසින් යෙද වූ දේශීය උපදේශකවරු 14 දෙනෙක් සඳහා ණය නියෝජිතායතනයේ හා ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අනුමැතියකින් තොරව පාරිශ්‍රමික ලෙස රු.මිලියන 1.35ක් ගෙවා තිබුණි.